*සැ.යු.*: 2025.11.07 දින පළ කරන ලද අංක 2462 *ගැසට්* පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,463 - 2025 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා - 2025.11.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 05 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 නොවැම්බර් මස 21 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82735 - (2025/11)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් ජේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඵ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ පවත්නා කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 12 ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහතින් දක්වා ඇති ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් ද සමග බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි **"කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණිය සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කර **2025.12.05 දින** හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය. **තව ද, පහත සබැඳිය ඔස්සේ ඇතුළත් කර ඇති Google Form ද නියමිත පරිදි සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,  
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,  
අංක 1200/9, රජමල්වත්ත පාර,  
බත්තරමුල්ල.  
Google form - https://forms.gle/LWiF fcxSxw7xiUtm8

**03. තනතුරේ ස්වභාවය හා රාජකාරි ව්‍යුහය :**

I. මෙම තනතුර ප්‍රාථමික, ශිල්පීය නොවන ගණයේ තනතුරකි.
II. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත **(විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.)**
III. ඔබ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.
IV. පත්වීම භාරගත් දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් විය යුතු ය. සේවා ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතු ය.
V. සෑම රාජකාරි දිනයකම පෙ.ව. 8.00 සිට ප. ව. 4.45 දක්වා රාජකාරියෙහි නියැලිය යුතු වේ. තව ද, මෙම තනතුරට අදාළ රාජකාරි වගකීම් අනුව ඕනෑම දිනයක රාජකාරි වේලාවෙන් බැහැරව රාජකාරි ඉටු කිරීමට බැඳී සිටිය යුතු ය.
VI. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතු ය.
VII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත් විය යුතු වේ.

**04. තනතුරේ කාර්යභාරය :**

ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා වන පොදු මූලික අවශ්‍යතාවයන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ නිපුණතාවයකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහු කාර්ය සේවා ගණයකි. මෙම කාර්ය පථයට අයත් ඕනෑම කාර්යභාරයක් ආයතන ප්‍රධානියා/පත්වීම් බලධාරියා විසින් මෙම සේවා ගණයට පවරනු ලැබේ.

*උදාහරණ -*

I. යතුරු රාජකාරි පැවරී ඇති අවස්ථාවන්හි දී පෙ. ව. 8.00ට පෙර කාර්යාලය විවෘත කිරීම.
II. නිලධාරීන් පැමිණීමට පෙර කාර්යාලයීය කාමර ඇතුළු අංශය පිරිසිදු කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම,
III. ලිපිගොනු ශාඛා අතර ගෙනයාම,
IV. ඡායා පිටපත් ලබා ගැනීම හා ෆැක්ස් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම,
V. සවස නිලධාරීන් සියලුම දෙනා කාර්යාලයෙන් පිටත්ව ගිය පසු සියලුම වායුසමීකරණ යන්ත්‍ර, විදුලි පහන් ක්‍රියා විරහිත කිරීම, සියලුම ජනෙල් දොරවල් නිසිලෙස වසා ඇති බව පරීක්ෂා කර තහවුරු කර ගැනීම,
VI. පරිගණක හා අනෙකුත් විදුලි උපකරණ ක්‍රියා විරහිත කර තිබේ ද යන්න පරීක්ෂා කර තහවුරු කර ගැනීම.

**05. සේවා කොන්දේසි :**

I. අවම වශයෙන් වසර 03ක කාලයක් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයට අනුයුක්තව සේවය කළ යුතු ය.
II. මෙම පත්වීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2310/29 හා 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් කරුණු ද අදාළ වේ.

**06. බඳවා ගැනීමේ සුදුසුකම් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
II. ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතු ය.
III. යහපත් චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
IV. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත්

පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු ය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි V පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතු ය.

VI. සෑම අයදුම්කරුවෙකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

VII. ඉල්ලුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

I. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් 12 දෙනා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් තෝරාගෙන පුරප්පාඩු සඳහා බඳවාගනු ලැබේ.

***සටහන* -** තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු අතර එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු ය.

II. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පටිපාටිය :

| *නිර්ණායකය* | | *ලකුණු* |
|---|---|---|
| ලබා ඇති වෘත්තීය සුදුසුකම් | | 5 |
| සන්නිවේදන හැකියාව | | 10 |
| අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස. (උ. පෙළ) සමත් වී තිබීම | 5 |
| | අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය, භාෂාව, දෙවන රාජ්‍ය භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ වෙනත් භාෂා සඳහා සාමාර්ථයක් ලබා තිබීම. (එක් භාෂාවක් සඳහා ලකුණු 02 බැගින් උපරිම විෂයයන් 5ක් සළකා බලනු ලැබේ. | 10 |
| පෞරුෂය | | 5 |
| බාහිර ක්‍රියාකාරකම් (ක්‍රීඩා/ සමාජ සේවා ..... යනාදී) | | 5 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | | 10 |
| **මුළු ලකුණු** | | 50 |

III. පත්වීම ක්‍රියාත්මකවන දිනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

**08. වැටුප :**

I. වැටුප් කේතය - PL- 1 - 2025

II. වැටුප් පරිමාණය -
රු. 40,000-10x450-10x490-10x540-12x590-
රු. 61,880
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන III අනුව නියමිත වැටුප ගණනය කරනු ලැබේ.)

**09. අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලේඛන :**

අයදුම්පත සමග පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්,

II. ජාතික හැඳුනුම්පතේ/ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ සහතික කළ පිටපතක්,

III. අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත්,

IV. ග්‍රාම නිලධාරි සහතිකය (DS 04 ආකෘතිය මගින්),

V. තෝරාගන්නා අයදුම්කරුවන් සම්බන්ධව පොලිස් නිශ්කාෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා පත්කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**12. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහකිරීමට කටයුතු කරනු ලැබේ.

13. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

15. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් හෝ ඒ පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි,

..........................................,
**ලේකම්,**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව.**

2025 ඔක්තෝබර් මස 30 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 1200/09,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

**ආදර්ශ අයදුම්පත්‍රය**

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ තනතුර සඳහා අයදුම්පත්‍රය**

කාර්යාල ප්‍රයෝජනය සඳහා [ ]

අයදුම් කරන භාෂා මාධ්‍යය සිංහල
දෙමළ
ඉංග්‍රීසි

1. මුලකුරු සමඟ නම : ..........................................................................................................................

2. මුලකුරු වලින් හැඳින්වෙන නම් **(සිංහලෙන්)** : ...................................................................................

3. ස්ථිර ලිපිනය : ......................................................................................................................................

4. ස්ථිර ලිපිනයට අදාළ පොලිස් වසම : ...................................................................................................

5. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ................................................................................................................

6. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

7. දුරකතන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

8. ස්ත්‍රී පුරුෂභාවය - ස්ත්‍රී - 1 පුරුෂ - 0 [ ]

9. විවාහක අවිවාහක බව - .........................................................................................................................

10. උපන් දිනය :- වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

11. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට (2025.12.05 දිනට) වයස :- අවු. [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

12. අධ්‍යාපන සුදුසුකම් :

12.1 *පළමුවර ප්‍රතිඵල* වර්ෂය .......................... මාසය ...................................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

12.2 *දෙවනවර ප්‍රතිඵල* වර්ෂය ................................... මාසය ..............................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 1. | |
| 2. | | 2. | |
| 3. | | 3. | |
| 4. | | 4. | |
| 5. | | 5. | |

12.3 අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල :
වර්ෂය ................................... මාසය .............................. විභාග අංකය ......................................
ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

13. වෙනත් සුදුසුකම් *:*

...........................................................................................................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................

14. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

15. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් : .......................................................................................................................
.....................................................................................................................................................

16. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐

17. ***අයදුම්කරුගේ සහතිකය :***

I. මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි.

II. මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

III. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.......................................................... ...................................................................,

දිනය අයදුම්කරුගේ අත්සන.

18. ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන මෙනවිය/මහත්මිය/ මයා ...................................................................... පෞද්ගලික වශයෙන් හඳුනන බව ද, ඇයගේ අත්සන/ දින ඔහුගේ .......................................................... ඇය මා ඉදිරිපිට / ඔහු, තැබූ බව මම සහතික කරමි.

දිනය : ..................................... ………...............................................,

සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාව)

11 - 149

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2025.12.01** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

**1. පුස්තකාල සහකාර තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 03)**

**1.1** *වැටුප් පරිමාණය :*

2025.03.25 දිනැති අංක 2025/04 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 51,020-11x590/10x680- රු. 64,310/-වේ.

(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 89,000.00 පමණ වේ.)

**1.2** *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**1.3** *සුදුසුකම් :*

**1.3.1 අධ්‍යාපනික:** සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් සහ ගණිතය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

**1.3.2 වෘත්තීය:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව(UGC)විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවේ පළමුවැනි කොටස සම්පූර්ණ කර තිබීම.

**1.3.3 පළපුරුද්ද:** රජයේ පුස්තකාලයක/පාර්ලිමේන්තු පුස්තකාලයේ අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**1.4** *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**1.5** *පරීක්ෂණ පටිපාටිය :*

**1.5.1** ***ලිඛිත/වෘත්තීය පරීක්ෂණය:*** රැකියා කාර්යභාරය සම්බන්ධව අයදුම්කරුගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බලනු ලබන අතර, ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

**1.5.2** ***සම්මුඛ පරීක්ෂණය:*** පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් තුළින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

**1.5.3** ලිඛිත / වෘත්තීය පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත නිර්ණායකයන් අනුව ලකුණු ලබා දෙනු ලැබේ. මෙහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

| | |
|---|---|
| i | අමතර අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් |
| ii | පරිගණක සාක්ෂරතාව |
| iii | සේවා පළපුරුද්ද |
| iv | සන්නිවේදන හා භාෂා කුසලතාව |
| v | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව |

**2. පිළිගැනීමේ නිලධාරි තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව -03)**

**2.1** *වැටුප් පරිමාණය:-* 2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 51,020 - 11 x 590 / 10 x 680 - රු. 64,310/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 89,000/- පමණ වේ).

**2.2** *වයස් සීමාව:-* අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

**2.3** *අධ්‍යාපන සුදුසුකම්:-* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල/ දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන ඇතුළුව, සම්මාන සාමාර්ථ පහක් සහිතව විෂයයන් හයකින් (06) එකවර සමත්වී තිබීම.

**2.4** *වෘත්තීය සුදුසුකම්:-* පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයක් මඟින් නිකුත් කරනු ලබන පාඨමාලා කාලය වර්ෂයකට නොඅඩු ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම;

*සහ*

පිළිගත් ආයතනයක පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම;

- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම සන්නිවේදනය කිරීමේ හැකියාව සහ වෙනත් විදේශීය භාෂාවන් කථා කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

**2.5** *පළපුරුද්ද:* **-** පිළිගත් ආයතනයක පිළිගැනීමේ නිලධාරි/පාරිභෝගික සේවා නිලධාරි තනතුරක අවම වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

*<u>ව්‍යතිරේකය</u>* **:**
වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සහිත පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ A,B හා C යන වැටුප් කාණ්ඩවලට අයත් සාමාජික/සාමාජිකාවන්ට උක්ත 2.5 වැනි ඡේදයෙහි සඳහන් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය නොවේ.

**2.6** *බඳවා ගැනීමේ ක්‍රමය:-*
ලිඛිත පරීක්ෂණයක්, කථන පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(අ) ***ලිඛිත පරීක්ෂණය :***

| *පරීක්ෂණය* | *පරීක්ෂා කරනු ලබන විෂයය ක්ෂේත්‍රයන්* |
|---|---|
| ලිඛිත පරීක්ෂණය | ඉංග්‍රීසි භාෂා හැකියාව සහ සාමාන්‍ය දැනීම |

(ආ) ***සම්මුඛ පරීක්ෂණය :***

ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ .එහි දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| | *නිර්ණායක* |
|---|---|
| 01 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 02 | විෂය දැනුම, කථන හැකියාව සහ පළපුරුද්ද |
| 03 | පරිගණක සාක්ෂරතාවය |
| 04 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |
| 05 | පැමිණීම, ජ්‍යෙෂ්ඨත්වය සහ කාර්ය සාධනය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා) |

**3.** **රියදුරු තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 02)**

**3.1** *වැටුප් පරිමාණය :*

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 51,020 – 11 x 590 / 10 x 680 – රු. 64,310/- වේ.

(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 89,000/- පමණ වේ).

**3.2** *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**3.3** *අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සමත්ව තිබීම.

**3.4** *වෘත්තීය සුදුසුකම් :*

බර වාහන ද ඇතුළුව සියලුම පංතිවල මෝටර් වාහන පැදවීම සඳහා බලපත්‍රයක් හිමිව සිටිය යුතුයි. (අයදුම්කරුට වාහනවල එදිනෙදා ඇති වන සුළු

අලුත්වැඩියා කිරීම් කර ගැනීමට හැකියාව තිබිය යුතු අතර මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම ඇති, නිවාඩු දින, සති අන්ත සහ සාමාන්‍ය රාජකාරි වේලාවන්වලින් පරිබාහිරව රාජකාරි කිරීමේ හැකියාව ඇති අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ)

*3.5 පළපුරුද්ද :*

රාජ්‍ය ආයතනයක / පිළිගත් ආයතනයක රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර 05 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

*3.6 බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත/ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

*3.7 පරීක්ෂණ ක්‍රමවේදය :*

අයදුම්පත් අතුරින් බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමේ මීළඟ අදියරයට කැඳවනු **ලැබේ.**

(අ) ලිඛිත/ ප්‍රායෝගික පරීක්ෂණය :

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් හෝ තෝරාගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් හෝ ලිඛිත පරීක්ෂණය/ ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලැබේ. එහි දී පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන් ඔස්සේ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| *පරීක්ෂණය* | *පරීක්ෂා කරනු ලබන විෂයය ක්ෂේත්‍රයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| ලිඛිත | මාර්ග නීති පිළිබඳ දැනුම/ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම/ සාමාන්‍ය දැනුම | 100 |
| ප්‍රායෝගික | රිය පැදවීමේ නිපුණතාව/ කායික යෝග්‍යතාව | 100 |

(ආ) සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත/ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහි දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| *අනු. අංකය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|
| 1 | වෘත්තීයභාවය සහ අන්තර් පුද්ගල කුසලතා |
| 2 | පළපුරුද්ද |
| 3 | භාෂා කුසලතාවය සහ සන්නිවේදන හැකියාව |
| 4 | ආකල්ප හා පෞරුෂය |
| 5 | සති අන්ත සහ නිවාඩු දිනවල රාජකාරි කිරීමේ හැකියාව |

*4. සේවා නියමයන් හා කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට අදාළවන මූලා හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත්කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

*5.* අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් **(මුල් පිටපත් නොවේ)** සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

6. රියදුරු තනතුර සඳහා පමණක් ඉහත 5 (අ) සිට (ඇ) දක්වා සහතිකවලට අමතරව සියලුම වර්ගවල වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක පිටපතක් ද ඇමිණිය යුතුයි.

7. රාජ්‍ය/පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

8. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

9. අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත් ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට ද හේතු වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා එවනු නො ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර,**
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2025 නොවැම්බර් මස 04 දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**ආදර්ශ අයදුම්පත**

*........................................ තනතුර*

01. (අ) මුලකුරු සමග නම (**සිංහලෙන්/ දෙමළෙන්**):- ..............................................................................
..............................................................................................................
..............................................................................................................

(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (**සිංහලෙන්/දෙමළෙන්**):- ..............................................................
..............................................................................................................
..............................................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs. /Miss)..............................................................
..............................................................................................................
..............................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | | | | |

03. (අ) i). පෞද්ගලික ලිපිනය :-..............................................................................................
..............................................................................................................
..............................................................................................................

ii). දුරකථන අංකය:- | | | | | | | | | | | |

iii). Whatsapp දුරකථන අංකය:- | | | | | | | | | | | |

iv). විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය:-........................................................

(ආ) i). කාර්යාලයීය ලිපිනය :- ..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

ii). කාර්යාලයීය දුරකථන අංකය:- | | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කල යුතු ලිපිනය

පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (අ) උපන් දිනය:- ..............................................................................................
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු ............ මාස:-.............. දින:-...........

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/ නැත)

08. අධ්‍යාපන සුදුසුකම්:- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| *අ.පො.ස. (සා.පෙළ)* | | |
|---|---|---|
| ***විෂයයන්*** | ***සාමාර්ථය*** | ***වර්ෂය*** |
| සිංහල/දෙමළ | | |
| ඉංග්‍රීසි | | |
| ගණිතය | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

| *පළපුරුද්ද (සහතික වල පිටපත් ඇමිණිය යුතු ය)* | | |
|---|---|---|
| ***ආයතනය*** | ***තනතුර*** | ***සේවා කාලය*** |
| | | |
| | | |

09. වෘත්තීය සුදුසුකම්:- ..............................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

10. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :-

(අ) ආයතනයේ නම හා ලිපිනය :- ..................................................................................................

....

..................................................................................................

(ආ) මුල් පත්වීමේ දිනය:-..................................................................................................

(ඇ) දැනට දරන තනතුර:-..................................................................................................

(ඈ) මාසික මූලික වැටුප :-..................................................................................................

(ඉ) දීමනා :-..................................................................................................

(ඊ) දළ වැටුප:-..................................................................................................

11. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න.
..................................................................................................

12. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම්, එම විස්තර සඳහන් කරන්න.
..................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත්, වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය :- ........................................ ..................................................
අයදුම්කරුගේ අත්සන

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය**

**(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ...............................තනතුර දරන,........................මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය :-.................................... ...................................................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වාග් චිකිත්සක තනතුරට උපාධිධාරීන් බඳවා ගැනීම - 2025

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සහ පළාත් සභා යටතේ පාලනය වන රෝහල් හි වාග් චිකිත්සක තනතුරේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය :-**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වාග් චිකිත්සක තනතුරේ පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිධාරීන් අතරින් **ලිඛිත විභාගයක් පවත්වා** බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :-**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කථන හා භාෂා චිකිත්සාව පිළිබඳව උපාධියක් ලබා තිබීම;

*හෝ*

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් එම උපාධිය විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කථන හා භාෂා චිකිත්සාව පිළිබඳ උපාධියක් විය යුතු ය.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචිය ලබා තිබීම.

**3. අනෙකුත් පොදු සුදුසුකම් :-**

(*අ*) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය;

(*ආ*) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය;

(*ඇ*) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;

(*ඈ*) ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය;

(*ඉ*) 2025.12.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය;

(*ඊ*) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. (අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.)

**4. බඳවා ගැනීමේ ලිඛිත විභාගය :-**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් සාමාන්‍ය දැනීම සහ බුද්ධි පරීක්ෂණය පිළිබඳ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීමෙන් පසුව බඳවා ගනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 01 | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | වාග් චිකිත්සක තනතුරට අදාළ විෂය දැනුම අදාළ කර තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම. | පැය 01 | 100 | 40 |

**5. සම්මුඛ පරීක්ෂණය :-**

බඳවා ගැනීමේ තරඟ විභාගයේ අදාළ ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක්, ලබා ඇති ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. තව ද මෙම සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම වාග් චිකිත්සක තනතුරට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර, එසේ තේරුම් ගත යුතු ද නොවේ.

*සටහන :-* සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වාග් චිකිත්සක තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

**6. අයදුම් කළ යුතු ආකාරය :-**

(අ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතිය අනුව ස්වකීය අයදුම්පත සකස් කළ යුතු අතර ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතු ය.

(ආ) උපාධි සහතිකයේ හා GPA අගය දැක්වෙන සහතිකයේ තමා විසින් සත්‍ය බවට සහතික කළ පිටපතක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) SLMC ලියාපදිංචි සහතිකය තමා විසින් සත්‍ය බවට සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අයදුම්පතේ "ලදුපත" ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන "සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම" යන ගිණුමට රු.1000.00 ක් බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබා ගන්න.)

(ඉ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.512,148 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

(ඊ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ "පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වාග් චිකිත්සක තනතුර සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2025" වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර 2025.12.01 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*සටහන :-* ඉහත 2 හා 3 යටතේ දැක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2025.12.01** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**7.** රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්, ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය.

**8.** මෙම *ගැසට්* නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා **2025.12.01** දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

**9. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:-**

(අ) ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින්ට පමණි.

(ආ) ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

**10. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම:-**

වාග් චිකිත්සක තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත විභාගයට පෙනී සිට එයින් සමත් වී අවශ්‍ය සුදුසුකම් සපුරන ලද සීමිත අයදුම්කරුවන්/අයදුම්කාරියන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත දක්වා ඇති ලියවිලි වල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය:-

(1) උප්පැන්න සහතිකය;
(2) උපාධි සහතිකයේ මුල් පිටපත (සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතු ය);
(3) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය;
(4) පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය);
(5) SLMC ලියාපදිංචි සහතිකය (සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතු ය).

**11. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :-**

වාග් චිකිත්සක තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි අනුව එම තනතුරේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට කටයුතු කරන අතර, ලිඛිත විභාගයේ කුසලතාවය මත පත්වීම් ස්ථානය තීරණය කරනු

ලැබේ. වාග් චිකිත්සක තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MT-6-2025 හි පරිදි
රු.54,120 -10x800-11 x 1190 - 10 x 1320 -10 x 1350-
රු. 101,910/-
යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

**12.** අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පත්වීම ලැබීමෙන් පසු සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කරන බවත් දෙනු ලබන පත්වීම අවලංගු කර තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**13.** තෝරාගත් අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස තනතුරට පත්වී පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් තනතුරේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

**14.** ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ නිලධාරීන්ට අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

**15.** මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උදා වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

විශේෂඥ වෛද්‍ය **අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025 නොවැම්බර් මස 10 දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වාග් චිකිත්සක තනතුර සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2025**

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලන්න)

1. (*අ*) මුලකුරු සමග අගට යෙදෙන නම :- ..............................................................................
(ඉංග්‍රීසියෙන් කැපිටල් අකුරෙන්) උදා. A.B.C.SILVA

(*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..............................................................................

(*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :- ..............................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :- ......................................................... (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය :-

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |

4. (*අ*) ස්ථිර ලිපිනය :-

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |

(ආ) දුරකථන අංකය : ජංගම | | | | | | | | | | |

ස්ථිර | | | | | | | | | | |

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් ....................... ඉංග්‍රීසියෙන් ...........................................................................

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :- ................................................................................................

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :- ................................................................................................................................

5. උපන් දිනය :- වර්ෂය ........................... මාසය ........................... දිනය ..............................
2025. ……..... දිනට වයස අවුරුදු ........................ මාස ......................... දින ....................................

6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාල කොටුවේ √ ලකුණ යොදන්න.)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග ඔව් ☐ නැත ☐ (අදාල කොටුවේ √ ලකුණ යොදන්න.)

8. විවාහක/අවිවාහක බව :- විවාහක ☐ අවිවාහක ☐ (අදාල කොටුවේ √ ලකුණ යොදන්න.)

9. අධ්‍යාපන සුදුසුකම් :-

| *අනු අංකය* | *සමත් වූ උපාධිය* | *සාමාර්ථය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA)හා උපාධිය බල පවත්වන දිනය* | *විශ්වවිද්‍යාලය* | *අධ්‍යයන වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |

10. SLMC ලියාපදිංචි අංකය හා දිනය

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ√ ලකුණ යොදන්න.)

“ඔව්” නම් විස්තර සපයන්න :- ................................................................................................................................

12. **අයදුම්කරුගේ සහතිකය :-**

(අ) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාළ මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |

……................................ ................................................
දිනය අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

13. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලික දන්නා හඳුනන බවද, ඔහු/ඇය .............................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

........................................ ................................................,
දිනය සහතික කරන්නාගේ අත්සන,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

සහතික කරන නිලධරයාගේ සම්පූර්ණ නම :- ...................................................................................................................

තනතුර :- ...................................................................................................................................................

ලිපිනය :- ...................................................................................................................................................

14. **ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න.)**

i. ඉහත අයදුම්කරු/අයදුම්කාරියවන .......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ......... ........................................ තනතුර දරන බව මින් සහතික කරමි.

ii. ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය තනතුර සඳහා තෝරා ගත හොත් ඔහු/ඇය දරන තනතුරට නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

iii. එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිඳු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

................................................ ..............................................
දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :- ......................................................................................

තනතුර :-...............................................................................................................................

ලිපිනය :- ............................................................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් ලිපිකරු/ බීජ කාර්මික/ නේවාසිකාගාර පාලක/ නේවාසිකාගාර පාලිකා තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

Department of Agriculture
Open Competitive Examination for Recruitment for the Posts of Farm Clerk/ Seed Technician
Male Warden/ Female Warden - 2025

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් ලිපිකරු / බීජ කාර්මික/ නේවාසිකාගාර පාලක/ නේවාසිකාගාර පාලිකා තනතුරුවල III ශ්‍රේණියේ 2024.10.30 දිනට පවතින පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *විවෘත පදනම මත පුරවන පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| ගොවිපල් ලිපිකරු | 18 |
| බීජ කාර්මික | 02 |
| නේවාසිකාගාර පාලක | 03 |
| නේවාසිකාගාර පාලිකා | 01 |

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025.12.12** දිනය වන අතර, එදිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

03. විභාගයට ඉදිරිපත්වන අපේක්ෂක/ අපේක්ෂිකාවන් පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අවශ්‍ය වේ.

| *තනතුර* | *03.1 අධ්‍යාපන සුදුසුකම්* | | *03.2 වෘත්තීය සුදුසුකම්* | *අමතර සුදුසුකම්* |
|---|---|---|---|---|
| ගොවිපල් ලිපිකරු<br><br>නේවාසිකාගාර පාලක/ පාලිකා | i.<br><br>ii. | සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සමඟ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එක්වර විෂයයන් 06කින් අ.පො.ස. (සා. පෙළ) සමත් වී තිබීම<br>සහ<br>අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (සාමාන්‍ය ඉංග්‍රීසි හා සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. | අදාළ නැත | අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද |
| බීජ කාර්මික | i. | සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සමඟ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එක්වර විෂයයන් 06කින් අ.පො.ස. (සා. පෙළ) සමත් වී තිබීම;<br>*සහ* | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල මගින් පිරිනමනු ලබන දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>"හාඩි" කාර්මික ආයතනයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;<br>*හෝ* | අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද |

| | | | | |
|---|---|---|---|---|
| බීජ කාර්මික | (ii.) | අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සමත්ව තිබිය යුතු ය. | "ඇක්වයිනාස්" විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; *හෝ* ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යාල මගින් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; *හෝ* රජයේ අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාව; *හෝ* ඊට සමාන හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබීම | |

***සැළකිය යුතුයි -*** අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වනවිට සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු ය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.2 වෙනත් සුදුසුකම් - සියලුම අයදුම්කරුවන් පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති බවට සහතික විය යුතු ය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමත් ඒ තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් යෝග්‍ය කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

04. වැටුප
වැටුප් කේත අංකය - MN - 01 - 2025
වැටුප් පරිමාණය - රු. 45,230-10 x 540-11x 630-10 x890-10x 1,190-78,360

05. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා ඔබ විසින් දායක මුදල් ගෙවිය යුතු ය.

ii. නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද, සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

iii. දැනට බලාත්මක බඳවා ගැනීම් පටිපාටියේ කොන්දේසි හා ඉදිරියේදී කරනු ලැබිය හැකි බඳවා ගැනීමේ පටිපාටියේ සංශෝධනවලට ඔබ යටත් විය යුතු ය.

දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් කිසියම් පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

06. අයදුම් කළ යුතු ක්‍රමය -

(අ) මෙම විභාගය සඳහා වූ අයදුම්පත් ආකෘතිය මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. ඒ අනුව අයදුම්පත A4 (21cm x 30 cm) ප්‍රමාණයේ කඩදාසියක පමණක් දෙපැත්තේ ම පිළියෙල කළයුතු වේ. ඉල්ලුම්පත්‍රය ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවට ද 06 සිට 07(අ) තෙක් දෙවන පිටුවට ද, 07 (ආ) සිට 10 තෙක් තුන්වන පිටුවට ද, ඉතිරිය 04 පිටුවට ද වන ලෙස සකස් කළ යුතු ය. ඊට අදාළ තොරතුරු තම අත්අකුරින් පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද අවශ්‍ය වේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක. අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, (පාලන 01) ශාඛාව, පරන ගලහ පාර, පේරාදෙණිය වේ.

(ආ) ඉහත 03 වන ඡේදයෙ හි සඳහන් තනතුරු එකකට වැඩි ගණනකට ඉල්ලුම් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

(ඈ) ඉහත 03 ඡේදයේ වගුවේ සඳහන් තනතුරු අතරින් එක් තනතුරක් සඳහා විභාග ගාස්තුව රු. 1,000/- කි. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම්කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර, වෙන වෙනම විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එම ගාස්තුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ ඇති අංක **057-100179027204** දරන ගිණුමට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ එක් පසකින් පමණක් ඇලවිය යුතු ය. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු නොගෙවනු ලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

*සැලකිය යුතු යි -*

අයදුම්පත් ඉදිරිපත් කළයුතු අවසාන දිනය වනවිට සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය. *ගැසට් පත්‍රයේ* අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අසම්පූර්ණ හෝ අවිධිමත් හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තුවේ කිසිවකුගේ නමට අයදුම්පත් නොඑවිය යුතු අතර, එසේ එවන හෝ අතින් ගෙනවිත් භාරදෙන අයදුම්පත් කිසිවක් භාරගනු නොලැබේ. යම් අයදුම්පතක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ වන පැමිණිලි කිසිවක් සළකා බලනු නොලැබේ.

07. විභාග පටිපාටිය

(අ) විධිමත් ලෙස අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂක/ අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපතිවරයා වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර ලබාදෙනු නොලැබේ. නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ හෝ රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා අත්සන සහතික කරවා ගත යුතු ය.

(ආ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකරනු ඇත. එම නිවේදනය පළවී දින 04 හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එම දැන්වීමේ සඳහන් ආකාරයට අදාළ විස්තර ද, (අයදුම්පතේ ඡායා පිටපතක්, මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපතක් ලිපිය ලියාපදිංචි කළ දිනය හා කුවිතාන්සියේ ඡායා පිටපතක් හා මහනුවරින් බැහැර ප්‍රදේශයක් නම් ප්‍රවේශ පත්‍ර එවීමට ෆැක්ස් අංකයක්ද සහිතව) ඉල්ලීමක් පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පාලන 01 ශාඛාව වෙත වහාම එවිය යුතු වේ. ඔබගේ ලිඛිත ඉල්ලීම් ලිපියේ පිටපතක් ළඟ තබාගැනීම වඩාත් ඵලදායී වේ.

(ඇ) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඇ) අනන්‍යතාවය - තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. මේ සඳහා

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ,
II. වලංගු විදෙස් ගමන් බලපත්‍රය හෝ
III. වලංගු රියැදුරු බලපත්‍රය පමණක් සලකා බලනු ලැබේ.

(ඉ) විෂය නිර්දේශය :-

| *තනතුර* | *විෂයය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* | *විෂයය නිර්දේශය* |
|---|---|---|---|---|---|
| 1. ගොවිපල් ලිපිකරු<br>2. නේවාසිකාගාර පාලක/ පාලිකා | සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% | අපේක්ෂකයාගේ භාෂාව, සාහිත්‍ය, ඉතිහාසය, දේශපාලනය, විද්‍යාත්මක දැනුම, කෘෂිකර්ම සංවර්ධනය, ක්‍රීඩා පිළිබඳ ජාත්‍යාන්තර හා දේශීය තොරතුරු සම්බන්ධ කාලීන හා ඓතිහාසික කරුණු පිළිබඳ හා තනතුරේ ස්වභාවය අනුව තිබිය යුතු සාමාන්‍ය දැනුම මැන බැලෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40% | එකතු කිරීම, අඩු කිරීම ඇතුළු ගණිතමය සංකල්ප පිළිබඳ අවබෝධය හා සංඛ්‍යා රටාවන් හඳුනා ගැනීම, ගණිත ගැටළු විසඳීම, අක්ෂර වින්‍යාසය, නිවැරදිව උක්ත ආඛ්‍යාත සම්බන්ධය ගලපා වාක්‍ය ලිවීම, නිවැරදි භාෂාව හැසිරවීම හා යම් ගද්‍ය ඛණ්ඩයක් ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්න සම්බන්ධව අපේක්ෂකයාගේ තාර්කික හැකියාව විමසා බලන ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 3. බීජ කාර්මික | සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40% | අපේක්ෂකයාගේ භාෂාව, සාහිත්‍ය, ඉතිහාසය, දේශපාලනය, විද්‍යාත්මක දැනුම, කෘෂිකර්ම සංවර්ධනය, ක්‍රීඩා පිළිබඳ ජාත්‍යන්තර හා දේශීය තොරතුරු සම්බන්ධ කාලීන හා ඓතිහාසික කරුණු පිළිබඳ හා තනතුරේ ස්වභාවය අනුව තිබිය යුතු සාමාන්‍ය දැනුම මැන බැලෙන ප්‍රශ්න වලින් සමන්විත වේ. අභියෝගතා පරීක්ෂණය සඳහා එකතු කිරීම, අඩු කිරීම ඇතුළු ගණිතමය සංකල්ප පිළිබඳ අවබෝධය හා සංඛ්‍යා රටාවන් හඳුනා ගැනීම, ගණිත ගැටළු විසඳීම, අක්ෂර වින්‍යාසය, නිවැරදිව උක්ත ආඛ්‍යාත සම්බන්ධය ගලපා වාක්‍ය ලිවීම, නිවැරදිව භාෂාව හැසිරවීම හා යම් ගද්‍ය ඛණ්ඩයක් ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්න සම්බන්ධව අපේක්ෂකයාගේ තාර්කික හැකියාව විමසා බලන ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| | තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 01 | 100 | 40% | 1. සාමාන්‍ය කෘෂිකර්මය<br>I. දේශගුණය, කෘෂි දේශගුණික හා පාරිසරික කලාප හා එහි ස්වභාවය, වැවිලි බෝග වගා ක්‍රම<br>II. බෝග පිළිබඳ සාමාන්‍ය අවබෝධය හා නිර්දේශිත ප්‍රභේද හා ප්‍රභේදාත්මක ලක්ෂණ<br>III. රාජ්‍ය බීජ ප්‍රතිපත්තිය<br>IV. බීජ ව්‍යුහය සංයුතිය හා ගුණාත්මය<br>V. බීජ නිෂ්පාදන මූලධර්ම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | VI. බීජ නිෂ්පාදන වැඩපිළිවෙළ හා ගණනය කිරීමේ වැඩසටහන<br>VII. බීජ ආනයනය හා බෙදා හැරීම පිළිබඳ ගුණාත්මක පාලන ක්‍රම<br>VIII. බීජ සහතික කිරීමේ ක්‍රියාවලිය<br>IX. බීජ සැකසීම හා ගබඩා කිරීම<br>2. බීජ තාක්ෂණය (බීජ වර්ගවල අක්‍රීය කාල පරාස, බීජ ස්වයතා පරීක්ෂණය, ප්‍රරෝහණ පරීක්ෂාව, පාරිශුද්ධතාවය, භෞතික පාරිශුද්ධතාවය, තොග තත්ත්ව පරීක්ෂාව, තෙතමනය, පරීක්ෂණාගාර පිරිසිදු කිරීම, අනෙකුත් ගුණාත්මක පරීක්ෂාවන්) |

*ගොවිපල් ලිපිකරු, බීජ කාර්මික තනතුර, නේවාසිකාගාර පාලක, නේවාසිකාගාර පාලිකා තනතුරු සඳහා ලිඛිත තරග විභාගය සමත් අපේක්ෂකයන් අතුරින් කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක අපේක්ෂකයින් සංඛ්‍යාවක් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එහිදී පහත ක්ෂේත්‍රයන් යටතේ මුළු ලකුණු 100 ලබාදෙනු ලැබේ.

*ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර :*

1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්
2. අතිරේක වෘත්තීය සුදුසුකම්
3. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද
4. භාෂා ප්‍රවීණතාව
5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය

*(ඊ) මාධ්‍යය* -

විභාගය සිංහල හා දෙමළ මාධ්‍යය දෙකෙන්ම පවත්වනු ලැබේ. ඉල්ලුම්කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(*උ*) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇත්නම් එම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(*ඌ*) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

(*එ*) *විභාගය පවත්වන ස්ථානය :*

මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මහනුවර විභාග මධ්‍යස්ථානවල දී පමණක් පවත්වනු ලැබේ.

**08.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

i. (*අ*) **ගොවිපල් ලිපිකරු** තනතුර සඳහා ලිඛිත පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙළ යටතේ විවෘත පදනම මත පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක අපේක්ෂකයින් සංඛ්‍යාවක් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණු එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගැනේ.

(*ආ*) **බීජ කාර්මික තනතුර** සඳහා ලිඛිත පරීක්ෂණයෙහි කුසලතා අනුපිළිවෙළ යටතේ විවෘත පදනම මත පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක (03) අපේක්ෂකයින් සංඛ්‍යාවක් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු

ලබන අතර, ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණු එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගැනේ.

(ඈ) **නේවාසිකාගාර පාලක, නේවාසිකාගාර පාලිකා** ලිඛිත පරීක්ෂණයෙහි කුසලතා අනුපිළිවෙල යටතේ විවෘත පදනම මත පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක (03) අපේක්ෂකයින් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණු එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගැනේ.

ii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ සුදුසුකම් සපුරා නොමැති බව තහවුරු වූ ඕනෑම අවස්ථාවක අයදුම්කරුගේ අපේක්ෂකත්වය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ කර නොමැතිව තිබිය දී විභාගයට ඉදිරිපත් ව විභාගය සමත්වුව ද, සම්මුඛ පරීක්ෂණය සඳහා සළකා නොලබන අතර, කිසිදු දැනුම්දීමකින් තොරව ඔහුගේ/ ඇයගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. ව්‍යාජ ලේඛන හා කූට ලේඛන ඉදිරිපත් කර යම් අයෙකු පත්වීම් ලබාගත්තේ වුව ද ඒ බව අනාවරණය වූ වහාම ඔහුගේ/ ඇයගේ පත්වීම අවලංගු කිරීමට හා ඔහුට / ඇයට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

09. සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. මෙම නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.doa.gov.lk වෙබ් අඩවියට පිවිස බාගත කරගත හැකි බවද කාරුණිකව දන්වමි.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධරයා වන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2025 ඔක්තෝබර් මස .......... දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් ලිපිකරු/ බීජ කාර්මික/ නේවාසිකාගාර පාලක/ නේවාසිකාගාර පාලිකා තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

Open Competitive Examination for Recruitment for the Posts of Farm Clerk/Seed Technician
Male Warden / Female Warden - 2025
Department of Agriculture

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය - සිංහල - 1
දෙමළ - 2 [ ]

02. ඉල්ලුම් කරන තනතුර :- ..........................................................................

(සිංහලෙන්/ දෙමළෙන්) ..........................................................................

(ඉංග්‍රීසියෙන්) ..........................................................................

03. නම
3.1 මුලකුරු සමග නම :- ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා :- GUNAWARDHANA, H, M. S. K.

3.2 සම්පූර්ණ නම :- ..........................................................................................................

..........................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3.4 දුරකථන අංකය : | | | | | | | | | | |

04. ස්ථිර ලිපිනය :

4.1 ඉංග්‍රීසි කැපිටල් අකුරින් : ..........................................................................................................

..........................................................................................................

4.2 සිංහලෙන්/ දෙමළෙන් : ..........................................................................................................

..........................................................................................................

4.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................................................................

..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

4.4 පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................................................................

4.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................................................

05. ස්ත්‍රී / පුරුෂ භාවය :-

ස්ත්‍රී - 1

පුරුෂ - 0

(අදාළ අංකය ලියන්න)

06. 6.1 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

6.2 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස

අවුරුදු | | | | | මාස | | | දින | | |

6.3 විවාහක/ අවිවාහක බව

අවිවාහක - 1

විවාහක - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. අධ්‍යාපන සුදුසුකම් (භාෂා මාධ්‍යය සමඟ)

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගය

I. වර්ෂය හා මාසය : ..........

II. විභාග අංකය : ..........

III. භාෂා මාධ්‍යය : ..........

IV. විභාග ප්‍රතිඵල : ..........

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3:1 හි සුදුසුකම් එකම සහතිකයක තිබිය යුතු ය.

| | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගය

I. වර්ෂය හා මාසය : ..........

II. විභාග අංකය : ..........

III. භාෂා මාධ්‍යය : ..........

IV. විභාග ප්‍රතිඵල : ..........

| | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

08. වෘත්තීය සුදුසුකම් : (ගොවිපල් ලිපිකරු/ නේවාසිකාගාර පාලක/ නේවාසිකාගාර පාලිකා තනතුර සඳහා වෘත්තීය සුදුසුකම් අදාල නොවේ.

| *ඩිප්ලෝමාව/ NVQ පාඨමාලාව* | *ඩිප්ලෝමාව/ NVQ සහතිකය නිකුත් කළ ආයතනයේ නම* | *මාධ්‍යය* | *විභාග අංකය* | *ඩිප්ලෝමාව වලංගු දිනය* | *සමත් වූ වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |

09. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වරදකරුව ඇත් ද:- ඔව්/ නැත
ඔව් නම් විස්තර සපයන්න.

..........

..........

10. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව ................................................
 10.1 ගාස්තු ගෙවන ලද දිනය ........................................................................
 10.2 ලදුපත් අංකය ........................................................................................
 10.3 මුදල ......................................................................................................

**විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ එක් පසෙකින් පමණක් අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.)**

11. අයදුම්කරුගේ සහතිකය -

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරාගැනීමට පෙර දැන ගත හොත්, මා නුසුදුස්සකු වීමට යටත්වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තව ද කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. එසේම මා විසින් ඉල්ලුම්කරන තනතුර සඳහා එක් ඉල්ලුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන බවට ද සහතික වෙමි.

දිනය : ..................................................  ...........................................................
අයදුම්කරුගේ අත්සන

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම -

මෙ අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ......................................................................... යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ ඇය මා ඉදිරිපිට දී ...................................................................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය : ............................................  .........................................................................................
අත්සන සහතික කරන ලද
නිලධාරියාගේ අත්සන

සහතික කරන ලද නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

***සටහන :***
දැනටමත් රජයේ තනතුරක් දරන අයදුම්කරුවෙකු විභාගයට ඉල්ලුම්කරන විට තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතු යි.

13. දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා (අනවශ්‍ය වචන කපා හරින්න)

ඉහත විස්තර දැක්වෙන අයදුම්කරුට/ අයදුම්කාරියට මෙම විභාගය සඳහා පෙනී සිටීමට *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති/ නැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදා හැරීමට හැකි/ නොහැකි බවත් සහතික කරමි.

...............................................  .....................................................
දිනය  දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර -තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ (MN 03- 2025) කාර්මික නිලධාරී (සිවිල්) තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉල්ලුම්පත්‍රය, මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 කඩදාසියේ (21 cm x 29 cm) දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අපේක්ෂකයා විසින් තම අත් අකුරින් ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍ර 2025.12.27 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්), III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025"** ලෙස සඳහන් කළ යුතුය.

රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයා / අපේක්ෂිකාව තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

**1. රැකියා විස්තරය:**

1.1. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන සුළු වාරිමාර්ග ඉදිකිරීම, අලුත්වැඩියා කටයුතු සම්බන්ධව සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම.

1.2. කෘෂි පාරවල් ඉදිකිරීම, අලුත්වැඩියා කටයුතු සම්බන්ධව සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම.

1.3. ගොඩනැගිලි ඉදිකිරීම් අලුත්වැඩියා කටයුතු සම්බන්ධව සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම.

1.4. ජල කළමනාකරණ වැඩ සටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

2.1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් වේ. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

2.2. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන්වන අංක 2310/29 දරන 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතු ය.

**3. සාමාන්‍ය සුදුසුකම්:**

3.1. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

3.2. විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

3.3. බඳවා ගන්නා නිලධාරීන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට කැමති විය යුතු ය.

3.4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

3.5. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිඳු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

3.6. සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම්, අයදුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු යි.

**4. අධ්‍යාපන සුදුසුකම්:**

සිංහල / දෙමළ / ඉංග්‍රිසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

අ.පො.ස (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා / ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත් වීම.

**5. වෘත්තීය සුදුසුකම්:**

ඉහත 4හි අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබීම.

I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන විසින් අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

6. රැකියා ක්ෂේත්‍රයට තෝරා ගැනීමේ පදනම:

6.1. ලිඛිත තරග විභාගයේ කොන්දේසි:

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර, පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. එම විභාගයේ දී විෂයන් දෙක සඳහාම ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ.

6.2. ලිඛිත තරග විභාගයට අදාළ විෂය නිර්දේශය:

විභාගය ප්‍රධාන වශයෙන් ප්‍රශ්න පත්‍ර 2කින් සමන්විත වේ.

1.බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 - මුළු ලකුණු 100

2.පොදු පරීක්ෂණය- කාලය පැය 1 - මුළු ලකුණු 100
(තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)

<u>**විෂය නිර්දේශය**</u>

01. **බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂක, අපේක්ෂිකාවන්ගේ භාෂා හැකියාව හා අවබෝධය, සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ මාදිලියේ, කෙටි පිළිතුරු මාදිලියේ වැනි වාස්තවික ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

02. **පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)**

වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව, බිම් මැනීම හා මට්ටම් කිරීම සහ මාන ශාස්ත්‍රය යන මූලික විෂයයන් පිළිබඳ සාමාන්‍ය දැනුම මැනෙන අයුරින් සැකසෙන බහුවරණ මාදිලියේ, කෙටි පිළිතුරු මාදිලියේ වැනි වාස්තවික ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

I. **වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව**

a. **මූලික කටයුතු**
අර්ථ දැක්වීම හා මූලධර්ම - වාරිමාර්ග වර්ග හා වාරිමාර්ග ක්‍රම
වාසි හා අවාසි - කාර්යක්ෂම සාධක

**b. ජල විද්‍යාව**
සමීක්ෂණය, මූලික ජල ගලනය ගණන් ගැනීම, ජල සමතුලිතතා සමීකරණය, වැවේ ජල තුලනය, ගංවතුර අධ්‍යනය ක්‍රියාත්මක කළ හැකි ක්‍රමය, ගංවතුර ජල ප්‍රස්ථාර

**c. ප්‍රධාන වැඩ**
බැම් වර්ග ධාරිතාව ගණනය කිරීම හා නිදහස් උස
ගංවතුර මට්ටම
වැවේ ජල හානි වීම්
වාන් නිර්මාණය කිරීම හා අමුණු නිර්මාණය කිරීම
සොරොව් නිර්මාණය

**d. ජල කළමනාකරණය**
නිරූපණය හා බෝග ජල අවශ්‍යතාවය නිශ්චය කිරීමේ ක්‍රම අර්ථ දැක්වීම, බෝග ජල අවශ්‍යතාවය හා වාරි ජල අවශ්‍යතා ගණනය කිරීම, පාංශු ජල තුලනය, ජල උස හා ජල සැපයුම් වාර ගණන, ජල ගලනය මැනීම, ඇළවල් නිර්මාණය කිරීම, මැනින්ගේ සමීකරණය, මූල ජල සම්පාදන ක්‍රම

**e. වාරිමාර්ග නඩත්තු කිරීම**
නඩත්තු වර්ග
ආදර්ශ නඩත්තු නියමයන්
නඩත්තු ක්‍රම
නඩත්තු ඇස්තමේන්තු

**II. බිම් මැනීම හා මට්ටම් කිරීම**

a. බිම් මැනීම
මූලධර්ම, ට්‍රාන්සිට් වර්නියර් තියොඩලයිට්, ඔප්ටිකල් තියොඩලයිට්, විද්‍යුත් චුම්භක දුර මැනීමේ උපකරණ, ත්‍රිකෝණගත කිරීම්, ඛණ්ඩාංක ක්‍රමය, ක්ෂේත්‍ර පොත් නඩත්තු හා සැලසුම් පිළියෙල කිරීම.

b. මට්ටම් කිරීම
මූලධර්ම, මට්ටම් උපකරණ, ඩම්පි ලෙවලය, ඉංජිනේරු ලෙවලය, ස්වයංක්‍රීය ලෙවලය, මට්ටම් කිරීමේ ප්‍රයෝජන, වැව් පතුල මැනීම, දික්කඩ හා හරස්කඩ ඇළවල් ලකුණු කිරීම, ස්ථාන මිනුම් ගැනීම, නිර්මිත මට්ටම් ගැනීම, පරස්පර මට්ටම් ගැනීම.

**III. මාන ශාස්ත්‍රය**

a. ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව මධ්‍ය රේඛා ක්‍රමයෙන් ප්‍රමාණ ගැනීම
b. ක්ෂේත්‍ර ජලය ගණනය කිරීම
c. ජ්‍යැනි මීටරය හා පරිමාණ භාවිතය
d. ඛණ්ඩාංක ක්‍රමය අනුව ක්ෂේත්‍ර ජල ගණනය කිරීම සිම්සන් නීතිය අනුව
e. පරිමාව ගණනය කිරීම
f. ප්‍රිස්මෝඩියල් නීතිය
g. පස්වැඩ
h. ගණනය කිරීම
i. "මෑස් හෝල්" රූ සටහන
j. හරස්කඩ කැපුම් හා පිරවීමේ ක්‍රමය, හරස් කැපුම් ක්‍රමය, සමෝච්ඡ රේඛා සිතියම මගින් පරිමාව ගණනය කිරීම

6.3. විභාගයේ භාෂා මාධ්‍යය:

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයා අයදුම්පත ඉදිරිපත් කළ භාෂා මාධ්‍යයෙන්ම විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතුය.

7. බඳවා ගැනීම:

ඉහත 4 හා 5 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති හා ලිඛිත විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

8. වැටුප් පරිමාණය (මාසික) :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන I යටතේ MN 3 -2025 වැටුප් පරිමාණය අනුව
රු.52,250-10×800-11×1,190-10×1,320-10×1,350-100,040 ( 10/2025 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.)

**9. ශ්‍රේණි උසස් කිරීම :**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලවය.

**10. විභාග ගාස්තු :**
අයදුම්කරුවන් විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු.1000/= ක මුදලක් ඕනෑම ගොවිජන

සේවා මධ්‍යස්ථානයකට ගෙවිය හැකි අතර, ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් මුදල් භාරගත් බවට ගො.සේ.ම./2 (අ) කුවිතාන්සිය අයදුම්කරුට ලබා දෙනු ඇත. එම කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය. කුමන හේතුවක් නිසා හෝ එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

**11. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 03ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

**12. අත්සන සහතික කිරීම :**

අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස් හෝ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර, මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුය.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**ධම්මික රණතුංග,**
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 06 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 537,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

ලිඛිත තරග විභාගයට පෙනී සිටින මාධ්‍යය :
සිංහල- S

දෙමළ- T

ඉංග්‍රීසි- E

(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න)

01. (i) මුලකුරු සමග නම: ..............................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: SILVA A.B.

(ii) සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) : ..............................................................................

..............................................................................

02. (i) ස්ථිර ලිපිනය:......................................................................................................................................................

..........................................................................................................................................................................

(ii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ...........................................................................................................

..........................................................................................................................................................................

(iii) අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..................................................................................................

(iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..................................................................................................................

03. ස්ත්‍රී /පුරුෂ භාවය:

පුරුෂ 0

ස්ත්‍රී 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. (i) උපන් දිනය :

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

(ii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු: | | | මාස: | | | දින: | | |

06. දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

07. විවාහක / අවිවාහක බව :

අවිවාහක 1
විවාහක 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. අ.පො.ස. (සා. /පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සඳහා පෙනී සිටි වර්ෂය හා මාසය :...................................................................................

(ii) අයදුම්කරුගේ විභාග අංකය:...........................................................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |

09. අ.පො.ස.(උ./පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සඳහා පෙනී සිටි වර්ෂය හා මාසය:..............................................................................................................

(ii) අයදුම්කරුගේ විභාග අංකය:..................................................................................................................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| ................................................................... | .................. |
| ................................................................... | .................. |
| ................................................................... | .................. |
| ................................................................... | .................. |

10. අනෙකුත් සුදුසුකම්: තාක්ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.)

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද:

.............................................................................................................................................................

.............................................................................................................................................................

12. (I) ගොවිජන සේවා මධ්‍යස්ථානයට මුදල් ගෙවූ කුවිතාන්සි අංකය හා දිනය :.......................................................

.................................................................................................................................................

(II) ගොවිජන සේවා මධ්‍යස්ථානය :................................ දිස්ත්‍රික්කය :............................................................

| |
|---|
| කුවිතාන්සි මුල් පිටපත මෙම කොටුවෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය.<br><br>(කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ සතුව තබා ගැනීම ඉදිරි විමසීම්වලදී ප්‍රයෝජනවත් වනු ඇත.) |

13. අයදුම්කරුගේ ප්‍රකාශය:

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්,මා නුසුදුස්සකු වීමටත්, තෝරා පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව ද දනිමි.

දිනය:......................................    ..................................................................,
අයදුම්කරුගේ අත්සන.

14. අත්සන සහතික කිරීම:

මෙහි අත්සන් කරන ලද ...........................................................................................හි පදිංචි ......................... ........................................................ මයා / මිය / මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහුගේ / ඇයගේ අත්සන ..... ...............................................දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

....................................,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ
නම:.............................................................
තනතුර:.......................................................
ලිපිනය:......................................................
දිනය:..........................................................

15. රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම අයදුම්කරු වන .......................................................................................මහතා / මහත්මිය / මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ................................................................. වශයෙන් ස්ථිර / තාවකාලික / අනියම් සේවකයෙකු / සේවිකාවක ලෙස සේවය කරන බවත්,ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

.................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

11 - 178/1

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර -තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරි (යාන්ත්‍රික) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ (MN 03- 2025) කාර්මික නිලධාරි (යාන්ත්‍රික) තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉල්ලුම්පත්‍රය, මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 කඩදාසියේ (21 cm x 29 cm) දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අපේක්ෂකයා විසින් තම අත් අකුරින් ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **අයදුම්පත්‍ර 2025.12.27 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරි (යාන්ත්‍රික), III ශ්‍රේණියට බඳවා ගැනීම - 2025"** ලෙස සඳහන් කළ යුතුය. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයා / අපේක්ෂිකාව තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

1. රැකියා විස්තරය:

1.1. යාන්ත්‍රික ඒකකයට අයත් යන්ත්‍රෝපකරණ / වාහන පිළිබඳව භාරව සිටීම සහ ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳව පරීක්ෂා කිරීම.

1.2. යන්ත්‍ර/ වාහන අළුත්වැඩියාව නිසි පරිදි නඩත්තු කිරීම සම්බන්ධ කටයුතු හා ඊට අදාළ ලිපි ලේඛන පවත්වාගෙන යාම.

1.3. එක් එක් කර්මාන්ත හා වැඩබිම්වලට ගැලපෙන යන්ත්‍ර හා වාහන තෝරා දීම.

1.4. යාන්ත්‍රික ඒකකයේ යාන්ත්‍රික කාර්යය මණ්ඩලය භාර නිලධාරි ලෙස කටයුතු කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා උපදෙස් ලබාදීම.

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

2.1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් වේ. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

2.2. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද මුදල් රෙගුලාසිවලටද රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන අංක 2310/29 දරන 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතු ය.

3. සාමාන්‍ය සුදුසුකම්:

3.1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

3.2. විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

3.3. බඳවා ගන්නා නිලධාරීන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට කැමති විය යුතු ය.

3.4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

3.5. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිඳු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

3.6. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම්, අයදුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු යි.

4. අධ්‍යාපන සුදුසුකම්:

සිංහල / දෙමළ / ඉංග්‍රිසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

අ.පො.ස (උ./පෙළ) විභාගයේදී විද්‍යා / ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන්

තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත් වීම.

5. වෘත්තීය සුදුසුකම්:

ඉහත 4හි අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබීම.

I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

*හෝ*

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

6. රැකියා ක්ෂේත්‍රයට තෝරා ගැනීමේ පදනම:

6.1. ලිඛිත තරඟ විභාගයේ කොන්දේසි:

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර, පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. එම විභාගයේ දී විෂයන් දෙක සඳහාම ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ.

6.2. ලිඛිත තරඟ විභාගයට අදාළ විෂය නිර්දේශය:

විභාගය ප්‍රධාන වශයෙන් ප්‍රශ්න පත්‍ර 2කින් සමන්විත වේ.

1.බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 - මුළු ලකුණු 100

2.පොදු පරීක්ෂණය - කාලය පැය 1 - මුළු ලකුණු 100
(තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)

<u>විෂය නිර්දේශය</u>

01. බුද්ධි පරීක්ෂණය

අපේක්ෂක, අපේක්ෂිකාවන්ගේ භාෂා හැකියාව හා අවබෝධය, සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ මාදිලියේ, කෙටි පිළිතුරු මාදිලියේ වාස්තවික ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

02. පොදු පරීක්ෂණය

1. මෝටර් යාන්ත්‍රික විද්‍යාව

I. ස්නේහනයේ වැදගත්කම, ස්නේහන ක්‍රම හා ඒවායේ දෝෂ නිරණය කිරීම.

II. ස්නේහන වර්ග හා ඒවා යෙදීම් සඳහා භාවිතා කරන උපකරණ ටයර් ටියුබ් හඳුනා ගැනීම.

III. ටයර් ටියුබ්වල සේවාවන් කිරීම.

IV. මෝටර් වාහනවල එන්ජින් කොටස්, ක්ලච් පද්ධතිය, බල සම්ප්‍රේෂණ පද්ධතිය හා වාහනයේ විවිධ කොටස්වල ක්‍රියාකාරීත්වය හා දෝෂ නිර්ණය කිරීම හා අලුත්වැඩියාවන්.

V. වාහන බොඩි කොටස්වල තහඩු වැඩ හා පින්තාරු කිරීම.

2. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණවල,

I. ද්‍රවබල පද්ධති පවත්වා ගැනීම, නඩත්තු හා අලුත්වැඩියාවන්

II. විදුලි / ඉලෙක්ට්‍රොනික / පරිගණක පද්ධති පවත්වාගෙන යාම, නඩත්තු හා අළුත්වැඩියාවන්.

III. යන්ත්‍රවල අන්ඩර්කැරේජ් හා ක්‍රියාකරන කොටස්වල තත්ත්වය පවත්වාගෙන යාම, නඩත්තු හා අලුත්වැඩියාවන්

3. යන්ත්‍රාගාර

I. යාන්ත්‍රික ඒකකවල ඇති විවිධ වර්ගවල යන්ත්‍ර හඳුනා ගැනීම.

II. යාන්ත්‍රික ඒකකවල ඇති විවිධ වර්ගවල යන්ත්‍රවල නිවැරදි ක්‍රියාකාරීත්වය හා නඩත්තු.

4. ද්‍රව්‍යවල ගුණ හා සරල ගණනය කිරීම්

I. විවිධ ද්‍රව්‍යයන් හඳුනා ගැනීම.

II. ද්‍රව්‍ය මත බල ක්‍රියා කිරීමේදී හැසිරීම, පරිමාව, බලය, බලසූර්ණය, කාර්යය, කාර්යක්ෂමතාව වැනි සරල ගණනය කිරීම්.

5. ආරක්ෂිත ක්‍රම

I. යාන්ත්‍රික ඒකකවල/ යන්ත්‍රෝපකරණවල තිබිය යුතු ආරක්ෂිත ක්‍රම

6. ඉගැන්වීමේ ක්‍රම

ඉහත සඳහන් යාන්ත්‍රික ඒකකයක යන්ත්‍රවල නිවැරදි භාවිතය, දෝෂ නිර්ණය කිරීම සහ නඩත්තුව පිළිබඳ සිද්ධාන්තික හා ප්‍රායෝගික පන්ති පැවැත්වීමේ දී අනුගමනය කරන ඉගැන්වීම් ක්‍රම හා ඉගැන්වීමේ ආධාරක පිළියෙල කිරීම, නවීන ඉගැන්වීමේ ආධාරක පිළිබඳ අවබෝධය

6.3. විභාගයේ භාෂා මාධ්‍යය:

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයා අයදුම්පත ඉදිරිපත් කළ භාෂා මාධ්‍යයෙන්ම විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතුය.

7. බඳවා ගැනීම:

ඉහත 4 හා 5 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති හා ලිඛිත විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

8. වැටුප් පරිමාණය (මාසික) :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන I යටතේ MN 3- 2025 වැටුප් පරිමාණය අනුව

රු.52,250-10×800-11×1190-10×1320-10×1350-රු.100,040 (10/2025 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.)

9. ශ්‍රේණි උසස් කිරීම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලවය.

10. විභාග ගාස්තු

අයදුම්කරුවන් විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු. 1000/= ක මුදලක් ඕනෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකට ගෙවිය හැකි අතර, ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් මුදල් භාරගත් බවට ගො.සේ.ම./2 (අ) කුවිතාන්සිය අයදුම්කරුට ලබා දෙනු ඇත. එම කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය. කුමන හේතුවක් නිසා හෝ එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

11. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 03ක් ඇතුලත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

12. අත්සන සහතික කිරීම

අයදුම්පතෙහි අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකාරයෙකු හෝ දිවුරුම් කොමසාරිස් හෝ නීතිඥවරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර, මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතුය.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**ධම්මික රණතුංග,**
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 06 දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 537,
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් **කාර්මික නිලධාරී (යාන්ත්‍රික)** III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

ලිඛිත තරඟ විභාගයට පෙනී සිටින මාධ්‍යය

සිංහල- S

දෙමළ- T

ඉංග්‍රීසි- E

(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න)

1. (i) මුලකුරු සමඟ නම: ..........................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: SILVA A'B

(ii) සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) : ..........................................................................

..........................................................................

2. (i) ස්ථිර ලිපිනය:..........................................................................

..........................................................................

(ii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..........................................................................

..........................................................................

(iii) අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................

(iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................................................

3. ස්ත්‍රී /පුරුෂ භාවය:

පුරුෂ 0

ස්ත්‍රී 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

5. (i) උපන් දිනය :

වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

(ii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු: [ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

6. දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

7. විවාහක / අවිවාහක බව : [ ]

අවිවාහක 1
විවාහක 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

8. අ.පො.ස. (සා /පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සඳහා පෙනී සිටි වර්ෂය හා මාසය :..........................................................................

(ii) අයදුම්කරුගේ විභාග අංකය:...................................................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |

9. අ.පො.ස.(උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සඳහා පෙනී සිටි වර්ෂය හා මාසය:..................................................................................

(ii) අයදුම්කරුගේ විභාග අංකය:.......................................................................................................

10. අනෙකුත් සුදුසුකම්: තාක්ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.)

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද:

.....................................................................................................................................

.....................................................................................................................................

12. (I) ගොවිජන සේවා මධ්‍යස්ථානයට මුදල් ගෙවූ කුවිතාන්සි අංකය හා දිනය :.............................

.....................................................................................................................................

(II) ගොවිජන සේවා මධ්‍යස්ථානය :................................ දිස්ත්‍රික්කය :.................................

කුවිතාන්සි මුල් පිටපත මෙම කොටුවෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය.

(කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ සතුව තබා ගැනීම ඉදිරි විමසීම්වල දී ප්‍රයෝජනවත්වනු ඇත.)

13. අයදුම්කරුගේ ප්‍රකාශය:

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්,මා නුසුදුස්සකු වීමටත්, තෝරා පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව ද දනිමි.

දිනය:...................................... ..................................................................,

අයදුම්කරුගේ අත්සන.

**14. අත්සන සහතික කිරීම:**

මෙහි අත්සන් කරන ලද ..................................................................................................හි පදිංචි ................ ................................................................... මයා / මිය / මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහුගේ / ඇයගේ අත්සන....................................................දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

.................................... ,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ -

නම:............................................................

තනතුර:.......................................................

ලිපිනය:......................................................

දිනය:..........................................................

15. රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම අයදුම්කරුවන ....................................................................................මහතා / මහත්මිය / මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ................................................................. වශයෙන් ස්ථිර / තාවකාලික / අනියම් සේවකයෙකු / සේවිකාවක ලෙස සේවය කරන බවත්,ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

.................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

11 - 178/2

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩය - 03 සේවා ගණයට අයත් තාක්ෂණ සහයක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 03 සේවා ගණයට අයත් තාක්ෂණ සහයක තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉල්ලුම්පත්‍රය, මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 කඩදාසියේ (21 cm* x 29 cm) දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අපේක්ෂකයා විසින් තම අත් අකුරින් ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **අයදුම්පත්‍ර 2025.12.27 දින හෝ ඊට පෙර ලැබෙන සේ** "ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහයක, III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025" ලෙස සඳහන් කළ යුතුය.

රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයා / අපේක්ෂිකාව තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

**1. රැකියා විස්තරය:**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, ජල කළමනාකරණ හා පුරන් කුඹුරු අස්වැද්දීම යටතේ නව ඉදිකිරීම්, වැඩි දියුණු කිරීම් හා අලුත්වැඩියා කිරීම් සඳහා වන වැඩ පරීක්ෂා කිරීමට සහ ඉදිකිරීම්වලට අදාළ සැලසුම් නිර්මාණය කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීමට සහාය වීම.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

2.1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් වේ. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

2.2. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලටද රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන්වන අංක 2310/29 දරන 2022.12.14 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද දෙපාර්තමේන්තු නියෝගවලට ද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතු ය.

**3. සාමාන්‍ය සුදුසුකම්:**

3.1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

3.2. විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

3.3. බඳවා ගන්නා නිලධාරීන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට කැමති විය යුතු ය.

3.4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

3.5. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිඳු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

3.6. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම්, අයදුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු යි.

**4. අධ්‍යාපන සුදුසුකම්:**

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

ක්ෂේත්‍රයට අදාළ වන්නා වූ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා තුන (NVQ - 03) මට්ටමට ඇතුලත් වන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකය ලබා තිබීම.

**5. වෘත්තීය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා පහ (NVQ - 05) මට්ටමට ඇතුලත් වන්නා වූ රජයේ පිළිගත් තාක්ෂණ හා

කාර්මික විද්‍යාලයෙන් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ (සිවිල් ඉංජිනේරු) සහතිකය ලබා තිබීම.

**6. කායික සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කටයුතු මනා ලෙස ඉටු කිරීම සඳහා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**7. රැකියා ක්ෂේත්‍රයට තෝරා ගැනීමේ පදනම:**

7.1. ලිඛිත තරග විභාගයේ කොන්දේසි:

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර, පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. එම විභාගයේ දී විෂයයන් දෙක සඳහාම ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ.

7.2. ලිඛිත තරග විභාගයට අදාළ විෂය නිර්දේශය:

විභාගය ප්‍රධාන වශයෙන් ප්‍රශ්න පත්‍ර 2කින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 - මුළු ලකුණු 100
2. පොදු පරීක්ෂණය - කාලය පැය 1 - මුළු ලකුණු 100
   (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)

**විෂය නිර්දේශය**

01. **බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂක, අපේක්ෂිකාවන්ගේ භාෂා හැකියාව හා අවබෝධය, සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ මාදිලියේ, කෙටි පිළිතුරු මාදිලියේ වැනි වාස්තවික ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

02. **පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)**

වාරි මාර්ග ඉංජිනේරු විද්‍යාව, බිම් මැනීම හා මට්ටම් කිරීම සහ මාන ශාස්ත්‍රය යන මූලික විෂයයන් පිළිබඳ සාමාන්‍ය දැනුම මැනෙන අයුරින් සැකසෙන බහුවරණ මාදිලියේ, කෙටි පිළිතුරු මාදිලියේ වැනි වාස්තවික ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

I. **වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව :**

a. **මූලික කටයුතු**
අර්ථ දැක්වීම හා මූලධර්ම - වාරිමාර්ග වර්ග හා වාරිමාර්ග ක්‍රම
වාසි හා අවාසි - කාර්යක්ෂම සාධක

b. **ජල විද්‍යාව**
සමීක්ෂණය, මූලික ජල ගලනය ගණන් ගැනීම, ජල සමතුලිතතා සමීකරණය වැවේ ජල තුලනය, ගංවතුර අධ්‍යනය ක්‍රියාත්මක කළ හැකි ක්‍රමය, ගංවතුර ජල ප්‍රස්ථාර

c. **ප්‍රධාන වැඩ**
බැම් වර්ග ධාරිතාව ගණනය කිරීම හා නිදහස් උස
ගංවතුර මට්ටම
වැවේ ජල හානි වීම්
වාන් නිර්මාණය කිරීම හා අමුණු නිර්මාණ කිරීම
සොරොව් නිර්මාණය

d. **ජල කළමනාකරණය**
නිරූපනය හා බෝග ජල අවශ්‍යතාවය නිශ්චය කිරීමේ ක්‍රම අර්ථ දැක්වීම, බෝග ජල අවශ්‍යතාවය හා වාරි ජල අවශ්‍යතා ගණනය කිරීම, පාංශු ජල තුලනය, ජල උස හා ජල සැපයුම් වාර ගණන, ජල ගලනය මැනීම, ඇළවල් නිර්මාණය කිරීම, මැනින්ගේ සමීකරණය, මූල ජල සම්පාදන ක්‍රම

e. **වාරිමාර්ග නඩත්තු කිරීම**
නඩත්තු වර්ග
ආදර්ශ නඩත්තු නියමයන්
නඩත්තු ක්‍රම
නඩත්තු ඇස්තමේන්තු

II. **බිම් මැනීම හා මට්ටම් කිරීම**

a. **බිම් මැනීම**
මූලධර්ම, ට්‍රාන්සිට් වර්නියර් තියොඩලයිට්, ඔප්ටිකල් තියොඩලයිට්, විද්‍යුත් චුම්භක දුර මැනීමේ උපකරණ, ත්‍රිකෝණගත කිරීම්, ඛණ්ඩාංක ක්‍රමය, ක්ෂේත්‍ර පොත් නඩත්තු හා සැලසුම් පිළියෙල කිරීම.

b. **මට්ටම් කිරීම**
මූලධර්ම, මට්ටම් උපකරණ, ඩම්පි ලෙවලය, ඉංජිනේරු ලෙවලය, ස්වයංක්‍රීය ලෙවලය, මට්ටම් කිරීමේ ප්‍රයෝජන,

වැව් පතුල මැනීම, දික්කඩ හා හරස්කඩ ඇළවල් ලකුණු කිරීම, ස්ථාන මිනුම් ගැනීම, නිර්මිත මට්ටම් ගැනීම, පරස්පර මට්ටම් ගැනීම.

III. **මාන ශාස්ත්‍රය**

a. ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව මධ්‍ය රේඛා ක්‍රමයෙන් ප්‍රමාණ ගැනීම
b. ක්ෂේත්‍ර ජලය ගණනය කිරීම
c. ප්ලැනි මීටරය හා පරිමාණ භාවිතය
d. ඛණ්ඩාංක ක්‍රමය අනුව ක්ෂේත්‍ර ජල ගණනය කිරීම සිම්සන් නීතිය අනුව
e. පරිමාව ගණනය කිරීම
f. ප්‍රිස්මෝඩියල් නීතිය
g. පස්වැඩ
h. ගණනය කිරීම
i. “මාස් හෝල්” රූ සටහන
j. හරස්කඩ කැපුම් හා පිරවීමේ ක්‍රමය, හරස් කැපුම් ක්‍රමය
k. සමෝච්ඡ රේඛා සිතියම මගින් පරිමාව ගණනය කිරීම

7.3. *විභාගයේ භාෂා මාධ්‍යය:*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයා අයදුම්පත ඉදිරිපත් කළ භාෂා මාධ්‍යයෙන්ම විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතු ය.

8. *බඳවා ගැනීම:*

ඉහත 4 හා 5 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති හා ලිඛිත විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

9. *වැටුප් පරිමාණය (මාසික) :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන I යටතේ MT 1- 2025 වැටුප් පරිමාණය අනුව
රු.50,090-10×540-11×630-10×1,010-10×1,190-රු.84,420 (10/2025 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.)

10. *ශ්‍රේණි උසස් කිරීම :*

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 03 සේවා ගණයට අයත් තාක්ෂණ සහායක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලවය.

11. *විභාග ගාස්තු :*

අයදුම්කරුවන් විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු.1,000/= ක මුදලක් ඕනෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකට ගෙවිය හැකි අතර, ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් මුදල් භාරගත් බවට ගො.සේ.ම./2 (අ) කුවිතාන්සිය අයදුම්කරුට ලබා දෙනු ඇත. එම කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය. කුමන හේතුවක් නිසා හෝ එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

**12.** ***රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම :***

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 03ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

**13.** ***අත්සන සහතික කිරීම :***

අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකාරයකු හෝ දිවුරුම් කොමසාරිස් හෝ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර, මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**ධම්මික රණතුංග,**
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 06 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 537,
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් තාක්ෂණ සහයක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

ලිඛිත තරග විභාගයට පෙනී සිටින මාධ්‍යය
සිංහල- S

දෙමළ- T

ඉංග්‍රීසි- E

(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න)

1. (i) මුලකුරු සමඟ නම: ........................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: SILVA A'B

(ii) සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) : ........................................

........................................

2. (i) ස්ථිර ලිපිනය:........................................

........................................

(ii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ........................................

........................................

(iii) අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :........................................

(iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :........................................

3. ස්ත්‍රී /පුරුෂ භාවය:

පුරුෂ 0

ස්ත්‍රී 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

5. (i) උපන් දිනය :

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

(ii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු: | | | මාස: | | | දින: | | |

6. දුරකථන අංකය : | | | | | | | | | | |

7. විවාහක / අවිවාහක බව :

අවිවාහක 1
විවාහක 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

8. අ.පො.ස. (සා /පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සඳහා පෙනී සිටි වර්ෂය හා මාසය :..........................................................................

(ii) අයදුම්කරුගේ විභාග අංකය:.................................................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |
| ........................................................ | .................. | .................................................... | .................. |

9. අ.පො.ස.(උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සඳහා පෙනී සිටි වර්ෂය හා මාසය:................................................................................

(ii) අයදුම්කරුගේ විභාග අංකය:..........................................................................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| .................................................................. | .................. |
| .................................................................. | .................. |
| .................................................................. | .................. |
| .................................................................. | .................. |

10. අනෙකුත් සුදුසුකම්: තාක්ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.)

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද:

............................................................................................................................................

............................................................................................................................................

12. (I) ගොවිජන සේවා මධ්‍යස්ථානයට මුදල් ගෙවූ කුවිතාන්සි අංකය හා දිනය :..............................
.........................................................................................................................

(II) ගොවිජන සේවා මධ්‍යස්ථානය :................................ දිස්ත්‍රික්කය :.................................

| |
|---|
| කුවිතාන්සි මුල් පිටපත මෙම කොටුවෙ හි නොගැළවෙන සේ ඇලවිය යුතුය.<br><br>(කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ සතුව තබා ගැනීම ඉදිරි විමසීම්වල දී ප්‍රයෝජනවත් වනු ඇත.) |

13. *අයදුම්කරුගේ ප්‍රකාශය:*

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි.මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්,මා නුසුදුස්සකු වීමටත්, තෝරා පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව ද දනිමි.

දිනය:...................................... .................................................................

අයදුම්කරුගේ අත්සන.

14. අත්සන සහතික කිරීම:

මෙහි අත්සන් කරන ලද ....................................................................................................හි පදිංචි ...................... .......................................................... මයා / මිය / මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහුගේ / ඇයගේ අත්සන .. ..................................................දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

....................................

සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ
නම:............................................................
තනතුර:......................................................
ලිපිනය:......................................................
දිනය:.........................................................

15. රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම අයදුම්කරු වන ...........................................................................මහතා / මහත්මිය / මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ................................................................. වශයෙන් ස්ථිර / තාවකාලික / අනියම් සේවකයෙකු / සේවිකාවක ලෙස සේවය කරන බවත්,ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

11 - 178/3

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

***රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින රෙජිස්ට්‍රාර් සේවයේ II වන පන්තියේ ඉඩම් රෙජිස්ට්‍රාර්/ හිමිකම් රෙජිස්ට්‍රාර්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරට පත්කිරීම සඳහා සීමිත තර. විභාගය - 2025***

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ ඉඩම් රෙජිස්ට්‍රාර්/ හිමිකම් රෙජිස්ට්‍රාර්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරු 25 ක් සඳහා පත්කිරීමට සුදුසුකම් සපුරා ඇති රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ I ශ්‍රේණියේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 ජනවාරි මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ wwwdoenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2025 නොවැම්බර් මස 17 දින පෙ.ව. 9.00 ට විවෘතවන අතර 2025 දෙසැම්බර් මස 12 දින රාත්‍රී 9.00ට අවසන් වේ.**

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර,සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

**01. සේවයට බඳවාගැනීමේ ක්‍රමවේදය :**

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත තර. විභාගයේ ප්‍රතිඵල මත, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලබා ගන්නා අපේක්ෂකයන්ගේ වැඩිම ලකුණු අනුපිළිවෙළ අනුව අපේක්ෂකයන් 30 දෙනෙකු (පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අමතර 20% ක්) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා නොදෙන) සඳහා කැඳවනු ලැබේ. එහිදී අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදුකරනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත අවශ්‍ය සියලු මූලික සුදුසුකම් සපුරාලන පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉහත විභාගයේ ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙළ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අදාළ තනතුරුවලට පත්කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

**සැළකිය යුතුය:**

(*අ*) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවක දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(*ආ*) පත්වීම සඳහා සුදුසුකම් ලබන යම් අයදුම්කරුවකු එම පත්වීම පිරිනමන අවස්ථාවේ දී බලපවත්වන රෙගුලාසි හා විධිවිධාන යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ, හැසිරීම කරණකොට ගෙන හෝ මෙම පත්වීම නොදීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**02. ලිඛිත විභාගය :**

I. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ජනවාරි මස කොළඹදී පවත්වනු ලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ නීතිරීති/ උපදෙස් පිළිපැදීමට අපේක්ෂකයන් යටත් වේ.

II. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වනු ලැබේ.

III. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

IV. ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම | පැය 3.00 | 100 | 40 |
| විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම | පැය 3.00 | 100 | 40 |

V. විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම | • ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත<br>• නොතාරිස් ආඥා පනත<br>• වංචා වැළැක්වීමේ පනත<br>• මුද්දර ගාස්තු පනත<br>• ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත<br>• සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීමේ පනත<br>• හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත<br>• රජයේ ඉඩම් පනත<br>• ඉඩම් සංවර්ධන ආඥාපනත<br>• උකස් පනත<br>• මෙම නීති යටතේ සම්පාදනය කළ නියෝග |
| විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම | • විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත<br>• උඩරට විවාහ සහ දික්කසාද පනත<br>• මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත<br>• උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත<br>• මරණ ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත<br>• කොන්සල් කර්තව්‍ය පනත<br>• දරුකමට හදාවඩා ගැනීමේ පනත |

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

i. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2012.05.22 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පටිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් මෙම තනතුරට පත්කරනු ලැබේ.

ii. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.

iii. නිලධාරින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

iv. තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාරගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබේ.

v. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන අනුව අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතුය.

vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද බඳවාගැනීම් පටිපාටියේ සඳහන් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත්වේ.

vii. ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**04. සුදුසුකම් :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට අපේක්ෂකයන් පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**I. පළපුරුද්ද ;**

(*අ*) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ I ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනට සක්‍රීය සේවයේ නියුතු නිලධාරියකු වීම;

(*ආ*) I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත්ව තිබීම;

(*ඇ*) අයදුම්පත් කැඳවන නිවේදනය මඟින් නියමකර ඇති දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 10/2020 හි සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

වයස : අදාළ නොවේ.

**II. කායික සුදුසුකම්;**

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

**III. වෙනත් සුදුසුකම් ;**

*a.* අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

*b.* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබිය යුතු ය.

**05. වැටුප් පරිමාණය :**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය -
රු. 54,920 – 10 x 800 – 11 x 1,190 – 10 x 1,320 – 10 x 1,350 රු. 102,710/- (MN-7-2025)

**06. විභාග කොන්දේසි :**

6.1 අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

6.2 විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions) ;
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon).

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

6.3 මෙම විභාගය 2026 ජනවාරි මස කොළඹදී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

6.4 අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.5 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාරනොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගතකර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

6.6 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද

විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

6.7 ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතිකකර තිබිය යුතුය. අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

6.8 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

6.9 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

6.10 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

*a*) ජාතික හැඳුනුම්පත;
*b*) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
*c*) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

6.11 එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**07.** **විභාග ප්‍රතිඵල :**

මෙම නිවේදනයේ 02 ඡේදයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබාගන්නා ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාව අනුව සකස් කරන ලද ප්‍රමුඛතා ලේඛනයක් රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළකිරීමට පියවර ගනු ලැබේ.

**08.** **සාවද්‍ය තොරතුරු සැපයීම:**

අයදුම්පතේ සඳහන්කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගවලට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහකිරීමට කටයුතු කරනු ලැබේ.

❖ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීම ද මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

**09**. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත්කර ඇති චක්‍රලේඛ හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය නිලධරගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියට හා ඊට සිදුකර ඇති සංශෝධනවල කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

10. සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 31 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

## සංශෝධනයයි
## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ආමාත්‍යාංශය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

අංක 2,459 දරන 2025 ඔක්තෝබර් මස 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025" විභාග නිවේදනයේ, 9.0 සුදුසුකම් ඡේදයෙ හි (ඉ) කොටසෙ හි අධ්‍යාපන සුදුසුකම් කොටස යටතේ පහත සටහන 3 ඇතුළත් කරනු ලැබේ.

**සටහන :** 3-9.0 (ඉ) (1), (2) i සහ (3) i යටතේ වන උපාධි සුදුසුකම්,

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

2. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් විය යුතු ය.

9.0 (ඉ) (3) ii යටතේ වන පශ්චාත් උපාධි සුදුසුකම්,

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන පශ්චාත් උපාධියක්;

*හෝ*

2. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන පශ්චාත් උපාධියක් ;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් පශ්චාත් උපාධියක් විය යුතු ය.

02. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වේ.

03. දැනටමත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස නිවේදනය කරනු ලැබේ.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 නොවැම්බර් මස 07 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

11-243/1

## සංශෝධනයයි
## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ආමාත්‍යාංශය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

අංක 2,459 දරන 2025 ඔක්තෝබර් මස 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025" විභාග නිවේදනයේ, 8.0 සුදුසුකම් ඡේදයෙහි 8.1 අධ්‍යාපන සුදුසුකම් කොටස යටතේ පහත සටහන 2 ඇතුළත් කරනු ලැබේ.

**සටහන :** 2-8.1 (ඉ) (1), (2) i සහ (3) i යටතේ වන උපාධි සුදුසුකම්,

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

2. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් විය යුතු ය.

8.1 (3) ii යටතේ වන පශ්චාත් උපාධි සුදුසුකම්,

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන පශ්චාත් උපාධියක්;

*හෝ*

2. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන පශ්චාත් උපාධියක් ;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් පශ්චාත් උපාධියක් විය යුතු ය.

02. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත් වේ.

03. දැනටමත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති නිලධාරින් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස නිවේදනය කරනු ලැබේ.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 නොවැම්බර් මස 07 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

11-243/2

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2025

Limited Competitive Examination for the Recruitment to the Grade III of the Sri Lanka Principals' Service – 2025

අංක 1885/31 හා 2014.10.22 දිනැති රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව හා අංක 2004/59 හා 2017.02.02 , අංක 2076/14 හා 2018.06.19 , අංක 2079/39 හා 2018.07.11, අංක 2208/18 හා 2020.12.30, අංක 2255/55 හා 2021.11.26 සහ අංක 2454/54 හා 2025.09.18 දිනැති එහි සංශෝධනයන් අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය **2026 මාර්තු** මස පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. පහත දැක්වෙන දිස්ත්‍රික්කයන්හි රජයේ පාසල්වල පවත්නා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම පිණිස පවත්වනු ලබන සීමිත තරග විභාගය වෙනුවෙන් මෙම නිවේදනයට අදාළව අයදුම්පත් භාරගනු ලැබේ. අදාළ සියලු සුදුසුකම් **2025.12.19** දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක හා දිස්ත්‍රික් අංක

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංකය* | *පුරප්පාඩු පවතින මාධ්‍යය* |
|---|---|---|
| කොළඹ | 01 | සිංහල/දෙමළ |
| ගම්පහ | 02 | සිංහල/දෙමළ |
| කළුතර | 03 | සිංහල/දෙමළ |
| මහනුවර | 04 | සිංහල/දෙමළ |
| මාතලේ | 05 | සිංහල/දෙමළ |
| නුවරඑළිය | 06 | සිංහල/දෙමළ |
| ගාල්ල | 07 | සිංහල/දෙමළ |
| මාතර | 08 | සිංහල/දෙමළ |
| හම්බන්තොට | 09 | සිංහල/දෙමළ |
| යාපනය | 10 | දෙමළ |
| මන්නාරම | 11 | දෙමළ |
| වවුනියාව | 12 | සිංහල/දෙමළ |
| මුලතිව් | 13 | සිංහල/දෙමළ |
| කිළිනොච්චිය | 14 | දෙමළ |
| මඩකලපුව | 15 | සිංහල/දෙමළ |
| අම්පාර | 16 | සිංහල/දෙමළ |
| ත්‍රිකුණාමලය | 17 | සිංහල/දෙමළ |
| කුරුණෑගල | 18 | සිංහල/දෙමළ |
| පුත්තලම | 19 | සිංහල/දෙමළ |
| අනුරාධපුර | 20 | සිංහල/දෙමළ |
| පොළොන්නරුව | 21 | සිංහල/දෙමළ |
| බදුල්ල | 22 | සිංහල/දෙමළ |
| මොණරාගල | 23 | සිංහල/දෙමළ |
| රත්නපුර | 24 | සිංහල/දෙමළ |
| කෑගල්ල | 25 | සිංහල/දෙමළ |

මෙම නිවේදනයේ "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයයි. "ව්‍යවස්ථා සංග්‍රහය" යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

**02. අයදුම්පත් යොමුකිරීම :**

**2.1** අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams / E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 නොවැම්බර් මස 17 වැනි දින පෙ.ව. 9.00** ට විවෘත වන අතර **2025 දෙසැම්බර් මස 19 වැනි දින ප.ව. 9.00**ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමුකළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**2.2** අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

**2.3** අයදුම්පත් යොමුකිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**03. විභාග දිනය හා නගර :**

3.1 මෙම විභාගය **2026 මාර්තු මාසයේ දී** පැවැත්වේ. විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

3.2 පහත සඳහන් ප්‍රධාන නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී විභාගය පවත්වනු ලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිවු | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන විභාග මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීම අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්වරයාට බලය තිබේ. එසේ අවලංගු කරන මධ්‍යස්ථානයකට අදාළ අයදුම්කරුවන් ඊට යාබද නගරයේ විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

**04.** ***සේවා කොන්දේසි* :**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/31 සහ 2014.10.22 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ සහ එහි සංශෝධනයන්හි පනවා ඇති කොන්දේසි හා එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධන සහ රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ.

**05.** ***වැටුප් පරිමාණය* :** GE 04 - 2025

රු. 72,280 -7X1670 -6X2400 -25X2970 - රු.172,620 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025හි III වන උපලේඛනය අනුව වැටුප් ගෙවීම සිදු කෙරෙනු ඇත)

**06.** ***සුදුසුකම්* :**

6.1 පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති සේවයේ ස්ථිර කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත්කිරීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

6.2 *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය ලබා තිබීම;

*හෝ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය සමග පහත සඳහන් එක් හෝ සුදුසුකමක් ලබා තිබීම.

*අ.* පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ විෂයය සංයුතියෙහි "අධ්‍යාපන විෂයය" පිළිබඳව අවම වශයෙන් 50% ක් අන්තර්ගත වන විෂයානුබද්ධ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක්,

*ආ.* ගුරු පුහුණු සහතිකය,

*ඇ.* ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව,

*හෝ*

(iii) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව / ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.

6.3 *පළපුරුද්ද* :

(*අ*) ඉහත 6.2 (i) හෝ 6.2 (ii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර පහක (05) සතුටුදායක සේවා

කාලයක් හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම ;

*හෝ*

(*ආ*) ඉහත 6.2 (iii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර හයක (06) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

*සටහන :* බඳවාගැනීමේ සුදුසුකම් සලකා බලනු ලබන 2025.12.19 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 01/2020 හා එහි සංශෝධනයන්හි ප්‍රතිපාදනයන්ට අනුව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ වැරදි පිළිබඳව පළමු වන උපලේඛනය යටතේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධරයකු එම වරද සිදුකළ දිනයේ සිට වසර (05) ක කාලසීමාවක් ද ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධරයකු එම වරද සිදුකළ දිනයේ සිට වසර දෙකක (02) කාලසීමාවක් ද ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25.2 වගන්තිය යටතේ දක්වා ඇති ලඝු විනය ක්‍රියා පටිපාටිය යටතේ විනය දඬුවමක් ලබා ඇති නිලධරයකු එම වරද සිදු කළ දිනයේ සිට වසරක (01) කාල සීමාවක් ද සේවය අතහැරයාමේ නිවේදනයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනයක් සලකා බලා නැවත සේවයේ පිහිටුවන ලද නිලධාරියකු නැවත සේවයේ පිහිටුවනු ලද දිනයේ සිට වසර දෙකක (02) කාලසීමාවක් ඉක්මවන තෙක් ද මෙම බඳවාගැනීමේ පරීක්ෂණය සඳහා පෙනීසිටීමට සුදුසුකම් නොලද අයදුම්කරුවකු සේ සලකනු ලැබේ. එවැනි දඬුවම් ලබා අදාළ කාලසීමාව නොඉක්මවන නිලධාරීන් මෙම පරීක්ෂණයට පෙනී සිට සමත් වුව ද පත්වීම් ලැබීමට හිමිකම් නොලබයි.

6.4 *කායික හා මානසික යෝග්‍යතාව* :

සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

6.5 *වෙනත් සුදුසුකම්* :

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය,
ii. විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා පවත්වන තරග විභාගය සඳහා තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර නැත,
iii. විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් *ගැසට්* නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය,
iv. ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර කර තිබිය යුතු ය.

6.6 *වයස* :
2025.12.19 දිනට වයස අවුරුදු 50 නොඉක්මවිය යුතු ය.
(ඒ අනුව 1975.12.18 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**07.** ***විභාග ගාස්තු* :**

7.1 විභාග ගාස්තුව රුපියල් එක්දහස් දෙසියය (රු.1200/-) කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ග ගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions),
iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon),
iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන -*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීම් කිරීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**08.** ***ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :**

8.1 මර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය.

අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E–mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ග ගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.2 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**09.** ***විභාගයට පෙනී සිටීම*** **:**

(i) අපේක්ෂක / අපේක්ෂිකාවක තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාගයේ පළමුවන ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අවස්ථාවේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට භාරදිය යුතු ය.

*සටහන :* අයදුම්කරුවකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු / ඇය තනතුරට පත්කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**10.** ***අනන්‍යතාව*** **:**

තමා පෙනී සිටි සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂක/අපේක්ෂිකාවක් ම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

**11.** ***සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම්*** **:**

අපේක්ෂකයකු /අපේක්ෂිකාවක මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු /අපේක්ෂිකාවක විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරනු ලැබ ඇති බව සනාථ වුවහොත් හෝ එසේ නැතහොත් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කරනු ලැබ ඇති බව හෙළිදරව් වුවහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

**12.** ***විභාග මාධ්‍ය*** **:**

(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(ii) අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුයි.
(iii) අපේක්ෂකයන් විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම තමා විසින් ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන් පමණක් පිළිතුරු සැපයිය යුතුය.
(iv) ඉල්ලුම් පත්‍රයේ සඳහන් විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

**13. බඳවා ගැනීමේ ක්‍රමය :**

13.1 අයදුම්කරුවකුට තම මනාපය අනුව පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක 03ක් සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

13.2 එක් එක් දිස්ත්‍රික්කයේ සිංහල හා දෙමළ මාධ්‍ය අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර ප්‍රසිද්ධ කරනු ලැබේ.

13.3 ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව එක් එක් දිස්ත්‍රික්කය සඳහා මනාපය පළකර ඇති අයදුම්කරුවන්ගෙන් එම දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොඅඩු සංඛ්‍යාවක් සිංහල හා දෙමළ මාධ්‍ය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (යම් දිස්ත්‍රික්කයක පවතින පුරප්පාඩු සංඛ්‍යාව දහයකට (10) අඩුවන අවස්ථාවේදී අයදුම්කරුවන් 20 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවනු ලැබේ.)

*සැ.යු* - අයදුම්කරු ලිඛිත විභාගයට පෙනීසිටින මාධ්‍යයෙන්ම සම්මුඛ පරීක්ෂණ පවත්වන අතර බඳවාගන්නා සියලු නිලධාරීන්ට සිංහල හා දෙමළ මාධ්‍ය පත්වීම් පමණක් ලබා දෙනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රවේශ විභාගය සඳහා මුහුණ දෙන නිලධාරින් සේවය සඳහා පිවිසෙන්නේ නම් ඔවුන් හට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2020 (ඇ) අනුව සන්ධාන භාෂාවෙන් නිදහස් වීමේ ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය. විභාග අයදුම්පතේ 1. (iv) අනුව පත්වීම් ලැබීමට අවශ්‍ය වන්නේ සිංහල මාධ්‍යයෙන් ද *නැතහොත්* දෙමළ මාධ්‍යයෙන් ද යන්න අනිවාර්යයෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය. එම කොටස සම්පූර්ණ නොකරන ලද 1.(i) අනුව ඉංග්‍රීසි මාධ්‍ය වරණ කොට ගත් අයදුම්පත් අසම්පූර්ණ අයදුම්පතක් ලෙස සලකා ඉවත් කරනු ලැබේ. කිසිදු අයදුම්කරුවකුට අයදුම්පතේ සඳහන් කර ඇති විභාග හා පත්වීම් මාධ්‍ය පිළිබඳ තොරතුරු කිසිදු කරුණක් මත පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

13.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලබන අතර, එම සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන සියලුම අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී කරවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව සැලකීම සඳහා හිමිකමක් ලෙස සලකනු නොලැබේ.

13.5 ලිඛිත පරීක්ෂණයේ දී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණුවල එකතුව අනුව එක් එක් දිස්ත්‍රික්කය සඳහා සකස් කරනු ලබන කුසලතා අනුපිළිවෙළ මත නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. එක් දිස්ත්‍රික්කයකට වඩා වැඩි දිස්ත්‍රික්ක සංඛ්‍යාවකට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් අයදුම්පතේ දක්වා ඇති මනාප අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. කිසිදු අයදුම්කරුවකුට අයදුම්පතේ සඳහන්කර ඇති මනාප අනුපිළිවෙළ කිසිදු කරුණක් මත පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

13.6 ඉහත සඳහන් පරිදි යම් දිස්ත්‍රික්කයක් සඳහා බඳවාගන්නා ලද නිලධාරියකු එම දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීම සඳහා අවම වශයෙන් දිස්ත්‍රික්කයේ වසර පහ (05) ක කාලයක් සේවය කළ යුතුය. එසේ සේවය කිරීමට එකඟ නොවුණහොත් ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගුකර කුසලතා ලේඛනයේ ඊළඟ අයදුම්කරුට අවස්ථාව ලබා දීමට කටයුතු කරනු ලැබේ.

13.7 යම් දිස්ත්‍රික්කයක මුළු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා නිලධාරින් බඳවාගැනීමට නොහැකිවන අවස්ථාවක දී ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය සඳහා නැවත සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ඉහත සඳහන් පරිදි පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

13.8 යම් දිස්ත්‍රික්කයක පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ලිඛිත පරීක්ෂණය සමත් ප්‍රමාණවත් නිලධාරින් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී එම ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය සඳහා පිළිවෙළින් එම දිස්ත්‍රික්කය අයත් පළාතේ හා සමස්ත ලංකා මට්ටමින් පවතින කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගැනීමට කටයුතු කරනු ලැබේ.

13.9 ලිඛිත පරීක්ෂණය : ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විතයි.

| | *විෂයය* | *උපරිම ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01 | අවබෝධය | 100 | පැය 1 ½ |
| 02 | පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය | 100 | පැය 2 |
| 03 | අභියෝග්‍යතාව හා සාමාන්‍ය දැනීම | 100 | පැය 1 ½ |

- සෑම විෂයයක්ම සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය.

13.10 විෂය නිර්දේශය :

(i) අවබෝධය :

පාඨ කිහිපයක අර්ථය වටහා ගැනීමට අපේක්ෂකයා සතු ශක්තිය, භාෂා භාවිතය පිළිබඳ අවබෝධය සහ සාරාංශගත කිරීම පිළිබඳ අවබෝධය මැන බැලීම සඳහා ප්‍රශ්න සකස් කරනු ලැබේ.

**(ii) පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය :**

පාසල් හා කළමනාකරණය තුළ ඇති විය හැකි සිද්ධි කිහිපයක් ඉදිරිපත් කර, එම සිද්ධිවලට ප්‍රතිචාර දැක්වීම හා ගැටලු නිරාකරණය පිළිබඳව අපේක්ෂකයන්ගේ අදහස් මතු කර ගැනීම අරමුණු කරගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.

**(iii) අභියෝග්‍යතාව හා සාමාන්‍ය දැනීම :**

පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් හා ප්‍රතිචාරය පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය හා ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරය තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික, භූගෝලීය හා අනෙකුත් අදාළ සාධක සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත් භාවය සහ අවබෝධය මැනීම සඳහා කොටස් දෙකකින් යුක්තව ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. එක් එක් කොටස සඳහා මිනිත්තු 45 බැගින් වෙන් කෙරේ.

**13.11 සම්මුඛ පරීක්ෂණය :**

**(i) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:**

ලිඛිත පරීක්ෂණයට ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව මත පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙළ අනුව තෝරා ගනු ලැබූ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වූ අපේක්ෂක සංඛ්‍යාවක් අපේක්ෂකයා විසින් සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන ලද සිය වරණයන් පදනම්කොට ගෙන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙහිදී බඳවා ගැනීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාරව මූලික සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. එමෙන්ම එම සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන සියලුම අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගි කරවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව සැලකීම සඳහා හිමිකමක් ලෙස සලකනු නොලැබේ.

**(ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:**

විදුහල්පති කාර්ය භාරයට අදාළ මාතෘකාවක් ඔස්සේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා පහත නිර්ණායක යටතේ ලකුණු 25ක් ලබා දෙනු ලැබේ.

| | *නිර්ණායක* | *ලකුණු* |
|---|---|---|
| 1 | හැඳින්වීම | 04 |
| 2 | ඉදිරිපත් කිරීමේ සැලැස්ම | 04 |
| 3 | ඉදිරිපත් කිරීමේ කුසලතාව | 08 |
| 4 | විෂය දැනුම | 05 |
| 5 | කාල කළමනාකරණය | 04 |
| | **එකතුව** | **25** |

අයදුම්කරුවන් ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා ලබාගත් ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අනු පිළිවෙලට දිස්ත්‍රික් පදනමින් පුරප්පාඩු සඳහා බඳවාගනු ලැබේ.

**13.12 ප්‍රතිඵල නිකුත් කිරීම :**

*ගැසට්* නිවේදනයේ 13.9 ලිඛිත පරීක්ෂණයේ දී හා 13.11 (ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය දිස්ත්‍රික් පදනමින් මාධ්‍ය අනුව වෙන් වෙන්ව විභාග දෙපාර්තමේන්තුව විසින් ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. අනුමැතිය ලද පසුව විභාගය සඳහා පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

**14. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

14.1 මෙම තනතුර ස්ථිරය. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

14.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛ, අණපනත් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි රීති අදාළ වේ.

14.3 ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

14.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතා මට්ටම් පත්වීමේ දින සිට වසර 05ක් ඇතුළත ලබා ගත යුතු වේ.

*සටහන* - නිලධාරියාගේ සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමඟම සම්පූර්ණ කළ යුතු වේ. එමෙන්ම යම් නිලධාරියකු අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමර්ථයක් හෝ ඊට ඉහළ සාමර්ථයක් ලබා තිබේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2020 හි ප්‍රතිපාදන ප්‍රකාරව සන්ධාන භාෂා අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ.

15. මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළ කරනු ලබන මෙම *ගැසට්* නිවේදනයේ භාෂා පාඨ අතර යම්කිසි අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 නොවැම්බර් මස 07 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන
සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

11-244

## සංශෝධනයයි

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2025**

අංක 2,460 දරන හා 2025 ඔක්තෝබර් මස 24 දිනැති *ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද "ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2025" විභාග නිවේදනයේ ඉංග්‍රීසි මාධ්‍ය පිටපතෙහි උපලේඛන I හි සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නාම ලේඛනයෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංක 5224 යටතේ "Kalmuna-Tamil" ලෙස සඳහන් නාමය "Kalmunai" ලෙස සංශෝධනය කරමි. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම කරුණු එලෙසම නොවෙනස්ව පවතී.

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 නොවැම්බර් මස 11 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

11 - 264

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.